# අපිරිසිදුකමෙන් වැඩි ලකුණු

**දැනට හෙළිදරව් වී ඇති අයුරු ලෝකයේ විසීමට නුසුදුසුම නගරය වන්නේ ඉන්දියාවේ නවදිල්ලි නගරයයි. අලුත්ම ගණන් හිලව්වලට අනුව නවදිල්ලි වැසියන්ගෙන් ලක්ෂයකටත් වැඩි පිරිසක් නොයෙකුත් රෝගාබාධවලට ලක්වී සිටිති. මීට මූලික වශයෙන්ම හේතු පාදක වී ඇත්තේ වායු දූෂණයයි.**

දැනට හෙළි වී ඇති අයුරු නවදිල්ලියේ සෑම වැසියන් පස් දෙනෙකුගෙන්ම දෙදෙනෙක් කුමක් හෝ පෙනහළු ආබාධයකට හෝ ලිංගික ආබාධවලට ලක්ව සිටිති.

නවදිල්ලියේ ජනගහනය මිලියන 14 කටත් වැඩිය

ඉන්දීය ජාතික පිළිකා ආයතනයේ සොයා ගැනීම්වලට අනුව වායු දූෂණය වීමෙන් විශේෂයෙන්ම ප්‍රතිශක්තිකරණ ඌනතාවටත් රුධිරය ආශ්‍රිත රෝගාබාධ බොහොමයකටත් හේතු කාරණා වී ඇත.

ලෝක සෞඛ්‍ය සංවිධාන පෙන්වා දෙන විදි-යට ලෝකයේ වායු දූෂිතම නගර දහය අතර නවදිල්ලිය ද එක් නගරයකි.

නවදිල්ලියේ වයස අවුරුදු 8 - 16 අතර, ළමයින් 4671 ක් යොදගෙන සිදු කෙරුණ පරීක්ෂණයකට අනුව මෙම වයසේ වෙනත් පෙදෙස්වල ළමයින්ට වඩා තුන් ගුණයක පිරිසක් ස්වසන පද්ධතියේ අසාමාන්‍යතා ඇත. කල්කටාවේ වගුරු බිම් ආශ්‍රිත පෙදෙස්වල ළමයින්ට පවා ස්වසන පද්ධතියේ මෙතරම් ආබාධ නැත.

ඒ මොනවා වුණත් නවදිල්ලියේ දූෂිත පරිසරයෙන් වැඩියෙන්ම බැටකන්නෝ ටැක්සි රියදුරෝ සහ නගරයට පිටතින් එදිනෙදා එන ජනතාවයි.

ඒ ටැක්සි රියදුරන් නිරතුරුවම දූෂිත වායුවට නිරාවරණය වීමෙති. එසේම එදිනෙදා පිටතින් එන ජනතාව එහි වෙසෙන ජනතාවට වඩා දෙගුණයකින් පමණ අපහසුතාවට ලක්වීමෙති. නවදිල්ලියේ වායු දූෂණයට මූලික කාරණාව වාහනයි. ඉන්දියාවේ සෙසු ප්‍රදේශ හා සැසඳීමේදී වාහන වැඩියෙන්ම ඇත්තේ නවදිල්ලියේයි. මෑත කාලයේ ගණන් හිලව්වලට අනුව නවදිල්ලියේ ඇති වාහන කන්දරාව ලක්ෂ 20 කටත් වැඩිය.

ඒ කෙසේ වුවත් ඉන්දියාවේ වසරකට 10000 කට ආසන්න පිරිසක් දූෂිත වායුවෙන් නොයෙකුත් ආබාධවලට ලක්වී සදහටම මිහිතලයෙන් සමුගනිති. ❑

---

Pollution Causing havoc in New Delhi
නමැති ලිපිය ඇසුරෙනි

රංජන් වික්‍රමනායක